## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවා ගණයට ගැනෙන නිලධරයන් සඳහා වන

## වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
## උතුරු මැද පළාත

**1. හැඳින්වීම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 වගන්තියේ සහ 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 (2) වගන්තියේ විධිවිධාන අනුව පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවා ගණයේ නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

**2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර**

**2:1 අදාළ නිලධරයන්**

ඒකාබද්ධ සේවයට අයත් පහත සඳහන් සේවාවන්හි නිලධරයන් සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාළ වේ.

i. උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක සේවය
ii. උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය
iii. උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරි සේවය
iv. උතුරු මැද පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවය
v. උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවය
vi. උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවය

**2:2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය**

2:2:1 තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2:2:2 එකම සේවා ස්ථානයක හෝ ඇමුණුම 01හි දක්වා ඇති සේවා ස්ථානයක හෝ එකම අමාත්‍යාංශය යටතේ සේවා ස්ථාන කිහිපයක් තුළ වසර 05කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරු වීම් වලට යටත් වේ.

2:2:3 ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථාන වල වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් අනිවාර්යයෙන්ම ස්ථාන මාරු වීම් වලට යටත් වේ.

2:2:4 පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ වසර 03ක් සම්පූර්ණ කරන ලද ඉහත 2:1 ගණයේ ලා ගැනෙන සියළුම නිලධාරීන්ද අනිවාර්යයෙන්ම ස්ථාන මාරුවීම් වලට යටත්ය.

**2:3 සේවා ස්ථාන වර්ගීකරණය -**

2:3:1 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ 203 වගන්තියෙහි (iii) හා (v) උප වගන්තිය අනුව පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවයේ නිලධරයන් සඳහා ඇමුණුම 01හි සඳහන් පරිදි සේවා ස්ථාන වර්ගීකරණය කරනු ඇත. මෙම වර්ගීකරණය ඉහත නිර්ණායකයන් අනුව වාර්ෂිකව වෙනස් විය හැක.

සටහන: ඇමුණුම 01හි දක්වා ඇති සේවා ස්ථාන වර්ගීකරණය අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා අනුරාධපුර නගරයද, පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා තමන්කඩුව නගරද කේන්ද්‍ර කරගෙන සකස් කර ඇත. මෙම වර්ගීකරණය නිලධාරියාගේ පදිංචි ස්ථානයට සාපේක්ෂව වෙනස් විය හැක.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු මැද පළාත.

CamScanner

## 2:4 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු

2:4:1 වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2:2:1 ඡේදය යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීමේදී 2:2:2 ඡේදයේ සඳහන් අවශ්‍යතා සපුරා ඇති නිලධරයන්ට ප්‍රමුඛතාවය ලබාදීමෙන් අනතුරු ව ඉතිරිවන පුරප්පාඩු සැළකිල්ලට ගෙන ස්ථාන මාරු නියෝග ලබාදෙනු ඇත.

2:4:2 යම් සේවා ස්ථානයකට ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතුරින් වැඩිම සේවා කාලයක් හෝ ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයකු (අනෙකුත් කොන්දේසි වලට යටත්ව) එම සේවා ස්ථානයට ස්ථාන මාරු කරනු ලැබේ.

2:4:3 ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක සේවය කළ නිලධරයකු යම් සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විට එම ඉල්ලීම ඉටු කිරීමට එකී ස්ථානයේ,ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කළ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයා ඉන් පිටතට මාරු කළ හැකිය.

2:4:4 ඉතා ප්‍රියමනාප / ප්‍රියමනාප සේවා ස්ථානයන්ට ස්ථාන මාරුවීම් ලබා දීමේදි වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථාන වල සේවය කළ නිලධාරින්ටය. මෙවැනි ස්ථාන මාරු වලදී සේවා කාලය හා නිලධරයන් ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ගැටළු තත්වයන් ද සළකා බලනු ලැබේ.

2:4:5 ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේ දී දෙපාර්තුමේන්තුවල සේවා අවශ්‍යතාවයන් ද කාර්යාල වල කාර්යමණ්ඩල කණිෂ්ඨ/ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමට ද හැම විටම උත්සහ කළ යුතු වේ.

2:4:6 ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවන්නේ නම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව කටයුතු නොකරන ආයතන ප්‍රධානීන්ගෙන් එසේ කටයුතු නොකිරීමට හේතු විමසනු ලැබේ. සාධාරණ හේතුවක් නොමැතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හරින දෙපාර්තමේන්තු ප්‍රධානීන් සම්බන්ධව ඔවුන්ගේ විනය බලධරයන් දැනුවත් කර විනයානුකූලව ක්‍රියා කරන ලෙසද දන්වනු ලැබේ.

## 2:5 සේවා කාලය ගණනය කිරීම.

2:5:1 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී කාල ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය (උදා:- 2020 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2019.12.31 දිනය).

2:5:2 සේවා කාලයන් ගණනය කිරීමේ දි සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ල යොමු කරයි. (තව ද නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ).

2:5:3 සේවා කාලය ගණනය කිරීමේදි අමාත්‍යාංශයක / දෙපාර්තමේන්තුවක හෝ ඒ යටතේ වූ වෙනත් කාර්යාලයක අඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

කිසියම් දෙපාර්තමේන්තුවක් / අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළද, එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ / අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ.

2:5:4 අමාත්‍යාංශ/ දෙපාර්තුමේන්තු ස්ථාපිතවීම හෝ අහෝසිවීම හෝ විෂය පථ වෙනස් වීම හේතුවෙන් එක් අමාත්‍යාංශයක /දෙපාර්තුමේන්තුවක සිට වෙනත් අමාත්‍යාංශයකට / දෙපාර්තුමේන්තුවකට අනුයුක්ත කිරීමට සිදු වූ නිලධරයන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේදි අහෝසි කරන ලද අමාත්‍යාංශයේ / දෙපාර්තුමේන්තුවේ සේවා කාලය ද අවම සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

2:5:5 විනය හේතු හෝ දඬුවම් මාරුවක් ලෙස ස්ථාන මාරු ලද නිලධාරින් හැර දෙපාර්තුමේන්තු ප්‍රධානියාගේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු ලද නිලධාරින්ගේ සේවා කාලය ගණනය කිරීමේ දී ඔවුන් අවසන් වරට සේවය කළ සේවා ස්ථානයේ සේවය කළ සේවා කාලයද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවම සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

2:5:6 සංවර්ධන නිලධාරින් සඳහා එක් වසරක පුහුණුව ආරම්භ කළ දිනය නොව නියමිත පුහුණුව අවසන් කිරීමෙන් පසු සංවර්ධන නිලධාරි සේවයේ තනතුරකට පත්වීම් ලබා දුන් දිනය ඔවුන්ගේ පත්වීම් දිනය ලෙස සළකා ස්ථාන මාරු අයදුම්පත් සම්පූර්ණ කළ යුතුය.

2:5:7 ඉතා ප්‍රිය මනාප සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකුට නැවත ඉතා ප්‍රිය මනාප සේවා ස්ථානයකට මාරුවීමට ඉල්ලුම් කළ හැක්කේ ඉතා ප්‍රිය මනාප සේවා ස්ථානයෙන් පිටතට ගොස් වසර 10ක් ගත වී ඇත්නම් පමණි.

සටහන : එසේ වුවද 2:4:4 ට අනුව පුරප්පාඩු පිරවීමෙන් අනතුරුව තව දුරටත් එම සේවා ස්ථානවල පුරප්පාඩු පවතින විට හා සේවා අවශ්‍යතාවය මත වාර්ෂික ස්ථාන මාරු කමිටු නිර්දේශ මත නැවත ඉතා ප්‍රිය මනාප සේවා ස්ථාන සඳහාද ස්ථාන මාරු නියෝග ලබාදීම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සළකා බලනු ඇත.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු මැද පළාත.

CamScanner

2:5:8 සේවාවන් එකකට වැඩි ගණනක සේවය කළ නිලධරයන්ගේ සේවා කාලය ගණන් ගැනීමේ දී පෙර සේවයක දී එම ප්‍රිය මනාප වූ සේවා ස්ථානයක සේවය කර ඇත්නම් එම සේවා කාලය ගණන් ගනු ලැබේ. (උදා :- කණිෂ්ඨ සේවක උසස්වීම් ලද නිලධරයන්ගේ කණිෂ්ඨ සේවක සේවා කාලය )

2:5:9 දැනට සේවය කරන නිලධාරිනියකගේ සේවා ස්ථානයක සේවා කාලය ගණනය කිරීමේ දී එම කාලය තුළදී ලබාගෙන ඇති ප්‍රසූත නිවාඩු (වැටුප් සහිත, අඩවැටුප් හා වැටුප් රහිත) කාලය ගණනය කරනු නොලැබේ.

2:5:10 ඉතා ප්‍රියමනාප / ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කරන නිලධරයන් විසින් නැවත ඉතා ප්‍රියමනාප / ප්‍රියමනාප ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථාන වලට ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය කළ නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

2:5:11 ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවයේ නියුතු නිලධාරිනියන් එම සේවා කාලය තුළ ප්‍රසූත නිවාඩු ලබා තිබේනම් ඒ බව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය සඳහා අයදුම්පත් කැඳවීමේ දී අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතු වේ. ඒ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ii. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් / පරිපාලන නිලධාරී
iii. වෙනත් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙක්
iv. එක් එක් සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්.

**4. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචනය කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබේ. එම සමාලෝචන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

I. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්
II. පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ සහකාර ලේකම්/ පරිපාලන නිලධාරී
III. වෙනත් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙක්
IV. එක් එක් සේවාවට අයත් රජයේ නිලධරයන්ගේ අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා මුදාහැර ඇති නිලධාරියෙක්

**5. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

**5:1 විශේෂිත කරුණු**

i. යම් නිලධරයකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී ආබාධිත තත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී ස්ථාන මාරුවීම් සිදු කරන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි.
එවැනි ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව මාරු මණ්ඩලය විසින් ප්‍රමුඛත්වය දක්වනු ඇත. මෙවැනි නිලධරයන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදු වන්නේනම් ඊට ආසන්නම කාර්යාලයකට හෝ නිලධරයාගේ ඉල්ලීමකට අදාළ කාර්යාලයට මාරු කළ යුතුය. (වාර්ෂික ස්ථාන මාරු කමිටුව හෝ අභියාචනා කමිටුව වෙත ඉදිරිපත් කරනු නොලැබූ ඉල්ලීම් සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.)
ii. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සහයක්ම දැරිය යුතු අතර ප්‍රියමනාප නොවන්නා වූ කාර්ය ස්ථානයන් හි සේවය සඳහා නිලධරයන් තෝරා ගැනීමේ දී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන් ද, පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දේ.
iii. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන් දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.
iv. ආබාධිත, පුනරුත්ථාපන කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරීන් ඔවුන්ගේ අබාධිත තත්වයට අගතියක් නොවන පරිදි ස්ථානමාරු වලට යටත් වේ.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු මැද පළාත.

CS CamScanner

**5:2 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් නොවන නිලධාරීන්**

i. අවුරුදු 55 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව ස්ථාන මාරු නොකළ යුතුය.

**5:3 වෘත්තීය සංගම් සඳහා අනුග්‍රහය**

i. කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගත් ඒකාබද්ධ සේවයේ සේවයකට අයත් වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේනම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතු වලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය.

ii. මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විඳීමට අපේක්ෂා කරන ඒකාබද්ධ සේවයේ වෘත්තීය සංගම්වල නිලධරයන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙල කර (ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයෙහි 7.5 උප වගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.2 උප වගන්තිය අනුව අනුග්‍රහය ලබාදිය යුතු වන්නේ, කවර නිලතල වලටද යන වගත්, කුමන සංගමයට ද යන වගත්, අනුයුක්ත කළ යුතු වන්නේ කවර ස්ථාන වලටද යන වගත්, පළාත් ප්‍රධාන ලේකම් විසින් තීරණය කරනු ලැබේ. මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සළකා බලනු නොලැබේ. ප්‍රියමනාප දෙපාර්තමේන්තුවල රැඳී සිටීමට මෙම අනුග්‍රහය අදාළ කර ගත නොහැක.

**6. ඒකාබද්ධ සේවා අංශයේ ස්ථාන මාරු කාල සටහන**

| | |
|---|---|
| ජුනි 01 ට පෙර | ස්ථාන මාරු කමිටු පිහිටුවීම |
| ජූලි 01 ට පෙර | උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කිරීම |
| ජූලි 30 ට පෙර | ආයතන ප්‍රධානීන් විසින් මෙම චක්‍රලේඛය තම සමස්ත කාර්ය මණ්ඩලය වෙත දැනුවත් කර අදාළ පරිදි ස්ථාන මාරු ඉල්ලුම්පත්‍ර හා ආකෘති, වාර්තා අමාත්‍යාංශ ලේකම් වෙත තම නිර්දේශ සහිතව ඉදිරිපත් කිරීම. |
| අගෝස්තු 15ට පෙර | දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතින් ලැබෙන හා තම අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ ඉල්ලුම්පත්‍ර හා වාර්තා අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම, වා.ස්.මා.අංක 05 හා වා.ස්.මා. අංක 06 ආකෘති වාර්තා දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම. |
| සැප්තැම්බර් 30ට පෙර | මාරු මණ්ඩල රැස්වී ස්ථාන මාරු තීරණ ගැනීම සහ මාරු මණ්ඩල තීරණ ආයතන ප්‍රධානීන් වෙත දැනුම් දීම |
| ඔක්තොම්බර් 15ට පෙර | ස්ථාන මාරු ලද නිලධාරීන් විසින් අභියාචනා ඉදිරිපත් කිරීම. |
| නොවැම්බර් 15 ට පෙර | අභියාචනා මණ්ඩල රැස්වී ස්ථාන මාරු තීරණ ගැනීම හා අභියාචනා මණ්ඩල තීරණ දැනුම් දීම. |
| පෙබරවාරි 01 දින | වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම. |

**7. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම**

7.1 වාර්ෂික ස්ථානමාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය නියමිත ආකෘති පත්‍රය (වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛයේ ප්‍රකාරව) ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තවද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමග ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියාකළ යුතු වන්නේය.

7.2 මාරු මණ්ඩල තීරණයකින් අතෘප්තියට පත් පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු විසින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි අදාළ අමාත්‍යාංශ ලේකම් වෙතද යොමු කළ යුතු වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු මැද පළාත.

CamScanner

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ නිලධාරියා වෙත ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදියද, ඊට අදාළ තම නිරීක්ෂණද, නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුළත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානියා වග බලා ගත යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන, වාර්තා නිරීක්ෂණ හා නිර්දේශ සමග එම වර්ෂයේ නොවැම්බර් 01 වැනි දිනට ප්‍රථම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයන්හි සඳහන් නියමයන්ට අනුකූලව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලැබේ.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ඉල්ලීම ලැබීමෙන් අනතුරුව, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, අදාළ ලිපිගොනු යථාවත් කර ගැනීම සඳහා එහි පිටපත් ආයතන ප්‍රධානියා වෙත යවනු ලබන්නේය.

7.8 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 239 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව ආණ්ඩුකාරවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු මැද පළාත.

CamScanner

ඇමුණුම -01

උතුරු මැද පළාතේ කාර්යාල පිහිටීම අනුව ස්ථානමාරු සඳහා වර්ග කිරීම

| අනුරාධපුර දිස්ත්‍රික්කය | පොළොන්නරුව දිස්ත්‍රික්කය |
|---|---|
| <u>ඉතා ප්‍රිය මනාප සේවා ස්ථාන</u><br><br>උතුරු මැද පළාතේ අනුරාධපුර නගර සභා සීමාව තුල පිහිටි පළාත් සභාවට අයත් සියලු කාර්යාල<br><br><u>ප්‍රිය මනාප සේවා ස්ථාන</u><br><br>1. ඉහත ඉතා ප්‍රිය මනාප සේවා ස්ථාන හැර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි අනෙකුත් පළාත් සභා කාර්යාල<br>2. තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>3. රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>4. මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>5. තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>6. මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>7. තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>8. කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>9. ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>10. නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>11. ම.නු.ප. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>12. කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>13. නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br><br><u>දුෂ්කර සේවා ස්ථාන</u><br><br>1. පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>2. විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>3. හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>4. කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>5. පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>6. ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>7. රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>8. පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>9. ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල | <u>ඉතා ප්‍රිය මනාප සේවා ස්ථාන</u><br><br>තමන්කඩුව ප්‍රා දේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br><br><u>ප්‍රිය මනාප සේවා ස්ථාන</u><br><br>හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br><br><u>දුෂ්කර සේවා ස්ථාන</u><br><br>1. දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>2. මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>3. ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>4. ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල<br>5. වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි සියලු පළාත් සභා කාර්යාල |

CamScanner